# කන්ද උඩරට රාජධානියේ පරිහානිය සහ බිඳවැටීම

අජිත් තිලවත්ත

ලොව සෑම ශිෂ්ටාචාරයක්ම හෝ රාජධානියක් කලායාගේ ඇවෑමෙන් බිඳවැටීම ස්වභාවික කරුණකි. කන්ද උඩරට රාජධානියට ද මෙම ධර්මතාවය බලපෑවේය. ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවා ගනිමින් සිටියදී උඩරට දේශපාලන තත්වය බිඳවැටුනේය. පිළිමතලව්වේගේ අභිමතය පරිදි කන්නසාමි කුමරු රජු බවට පත් කිරීමෙන් පසු තමන්ට කිරුළ දැරීමේ බලාපොරොත්තුව ඇතිව හෝ නැතහොත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජෙකු වශයෙන් සිටියදී රාජ්‍ය බලය ලබාගැනීමේ අරමුණෙනි.[1] මෙම පත් කිරීමේදී මහා සංඝරත්නය ද අවවාද ලබාදුන්හ. "ඇත්ගොව්වා තම ඇතා ගැන සැලකිලිමත් නොවුනහොත් අනුනගේ ජීවිත පණක් නොව තමාගේ ජීවිතයද විනාශ කරන බව පෙන්වා දුන්හ.[2] මෙයින් අවබෝධ වන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහගේ බලයට පත්වීම පිළිබඳ භික්ෂූන් වහන්සේලාද අනතුරු ඇඟ වූ බවයි. රජකමට සුදුසුකමක් හෝ පළපුරුද්දක් නොතිබුණු අවුරුදු 18 ක ළාබාලයකු රජකමට පත්වීමෙන් අර්බුද ගණනාවකට මුලපිරිණි. "උඩරට රාජධානිය" නම් කෘතියේ සඳහන් පරිදි පිළිමතලව්වේගේ පෞද්ගලික අභිලාෂයන් සපුරා ගැනීමේ අරමුණින් ක්‍රියා කිරීමත් සමග රාජසිංහ සහ පිළිමතලව්වේ වටා පිල් බෙදීමක් ඇතිවිය.[3] මෙම බෙදීම උඩරට රාජධානියේ පරිහානියට සෘජු වශයෙන් බලපෑවේය.

උඩරට භේදය ඇතිවනු දුටු පහතරට ඉංග්‍රීසිහු එය පුළුල්වන ආකාරයේ නොයෙක් කූට උපක්‍රමයන් යෙදූහ. තම ආධිපත්‍යය ස්ථාවර කරගැනීමට නම් උඩරට බලය අත්‍යාවශ්‍ය විය. රජු තුළින් පිළිමතලව්වේගේ අරමුණු ඉටු නොවුනු නිසා බ්‍රිතාන්‍යයන් සමඟ මිත්‍ර සබඳතා ඇතිකර ගැනීමට මාන බැලීය. ක්‍රි.ව. 1799 පෙබරවාරි මාසයේදී එවකට බ්‍රිතාන්‍යය ආණ්ඩුකාර සර් පෙඩ්රික් නෝර්ත් සමඟ අවිස්සාවේල්ලේදී මූලික සාකච්ඡාවක් පවත්වන ලදි.[4] ඊට පසු දෙසැම්බර් මාසයේදී ඇති වූ සාකච්ඡාවෙන් ප්‍රකාශ වුයේ උඩරට රජුගේ ජීවිතයට හානිකොට තමන්ව සිංහාසනාරූඩ වීමට ආණ්ඩුකාරවරයාගේ උපකාර ලැබුණහොත් ඉංග්‍රීසි ජාතිකයින්ට රටේ ආධිපත්‍යය ලැබෙන සේ ක්‍රියා කරන බවයි.[5] දෙපාර්ශවය සාකච්ඡා කිරීම මගින් පමණක් නොව ලිපි මගින්ද ස්වකීය අදහස් හුවමාරු කරගත්හ.

උඩරට රාජධානිය කරුණු ගණනාවක් නිසා බ්‍රිතාන්‍යයන්ට වැදගත් විය. උඩරට යටත් කරගතහොත් බ්‍රිතාන්‍යයන් යටතේ වූ ත්‍රිකුණාමල වරායත් බටහිර වෙරළබඩ ප්‍රදේශයත් අතර මාර්ගයක් තැනීමට හැකිවීමද ප්‍රමුඛ විය. උඩරට ප්‍රදේශයේ නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය පහතරට ආහාර අවශ්‍යතාවට සපුරාලීමට හැකිවිය. මේ වන විට උඩරට සහ පහතරට අතර වෙළෙඳ බාධක පැවතියා වුවත් ආධිපත්‍යය තහවුරු කිරීමෙන් ඒවා මගහරවා ගැනීමට හැකි බවට විශ්වාස කළේය. මෙම හේතු නිසා උඩරටට ආක්‍රමණයක් එල්ල කිරීමට නෝර්ත් ක්‍රියා කරන ලදි. ක්‍රි.ව. 1803 උඩරටට එල්ල කළ ආක්‍රමණය හුදෙක් පිළිමතලව්වේගේ කපටිකමත්, පෙඩ්රික් නෝර්ත්ගේ මෝඩකමත් නිසා ඇතිවූ බව පී.ඊ. මෙන්ඩිස් මහතා පවසයි.[6]

මේ වනවිට ගොඩනැගෙමින් පැවති වාතාවරණය පිළිබඳ රජු දැඩි අවධානයකින් පසුවිය. ක්‍රි.ව. 1800 මාර්තු මැක්ඩොවෙල් හමුදා සෙන්පති යටතේ දූත පිරිසක් සාකච්ඡා පැවැත්වීමට ගියද ඒ ගමන අසාර්ථක විය. මෙම ගමනේ ප්‍රධාන අරමුණ වූයේ සාකච්ඡා මාර්ගයෙන් කන්ද උඩරට රජුගේ බලතල හීනකොට රූකඩ රජෙකු ලෙස තබාගනිමින් උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍ය කිරුළට නතු කිරීම හෝ උඩරට රදළයන් තම අණසකට යටත්කොට එමගින් රාජ්‍ය බලය ලබා ගැනීමයි.[7] ආණ්ඩුකාරවරයා උඩරට නතුකර ගැනීම සඳහා තමන් යෙදූ ප්‍රථම පියවර අසාර්ථක වූ බැවින් ඒ සඳහා තව තවත් උපාය මාර්ග යෙදෙව්වේය. ඉංග්‍රීසීන් සහ රජු භේද කිරීමේ අරමුණින් පුත්තලමෙන් උඩරටට පැමිණ බ්‍රිතාන්‍ය යටත් වැසියන්ට ඔත්තුකරුවන් ලෙස සිතා නොයෙක් වධහිංසා පමුණුවා ඔවුන්ගේ ධනය කොල්ල කනලදි. මින් කෝපයට පත් ඉංග්‍රීසීන් උඩරට රජුට එරෙහිව 1803 දී ආක්‍රමණයක් මෙහෙය වූහ. ආක්‍රමණයකට මුහුණ දීමට නොහැකි වූ රජු ආරක්ෂාව පතා හඟුරන්කෙතට ගිය බැවින් අත් අඩංගුවට ගැනීමේ ප්‍රයත්නය අසාර්ථක විය. අවසානයේ උඩරට පැවති භූගෝලීය සාධක සහ දේශගුණික තත්ත්වයන් කිසිවක් නොදත් බ්‍රිතාන්‍යන්ට අන්ත පරාජයක් ලැබුණි.

නෝර්ත් ආණ්ඩුකාරයාගේ සේවා කාලයෙන් පසු 1805 තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරතුමා පත්විය. අවි බලයෙන් උඩරට ඇල්ලීමේ ක්‍රියාවලිය නවතා දැමූ හෙතෙම කාහටත් නොපෙනෙන පරිදි උඩරට රාජ්‍යයේ අත්තාවාරම බිඳීමේ සූක්ෂම පිළිවෙතක් ගෙන ගියේය.[8] මෙම කාර්යයන් සපුරා ගැනීම සඳහා ජෝන් ඩොයිලිගේ විසින් ඉටු කළ මෙහෙවර ප්‍රශංසනීය වේ. සිංහල භාෂාව කථාකිරීමට හැකියාවක් ඇතිව සිංහල උගතුන් සහ කවීන් ආශ්‍රය කළ බව පෙනේ. සිංහල සංස්කෘතිය හා බද්ධව ක්‍රියා කිරීමෙන් උඩරට රාජ්‍යයේ තතු දැනගැනීම සඳහා චරපුරුෂයකු ලෙසත් කටයුතු කරන ලදි. කපටිකම සහ අල්ලස් ලබාදීම යන ක්‍රම තුළින් උඩරට තතු දැනගැනීමට හැකිවිය.

රාජ්‍ය පාලන කටයුතු ගෙන යෑමේදී රජතුමා දෙබිඩි පිළිවෙතක් ගෙන ගියේය. එක් විටෙක නායක්කාර් ඥාතීන් තමාවෙත සමීප කරගනිමින් විශ්වාසයක් තබා කටයුතු කර, සූක්ෂමව රදළ පවුල් අතර මත භේද වර්ධනයට වැඩ කළේය. මෑත කාලයේ උසස් භාවයට පත්වූ මොල්ලිගොඩ පවුලට උසස් තනතුරු පිරිනැමීමෙන් ඒ බව තහවුරු වේ. එවිට ඇහැලේපොළ පවුල් තුළ ඊර්ෂ්‍යාව හටගෙන බේදීම ඇතිවන බව ඔහු මනාව දැන සිටියේය.[9] රජු විසින් අනුගමනය කළ පාලන උපක්‍රමය වූයේ රදළයකු පාලනය කළ

ප්‍රදේශයේ එකිනෙකට විරුද්ධ මත දරන ප්‍රධානීන් දෙදෙනෙකු අතරේ බෙදා වෙන් කිරීමයි. නිදසුනක් ලෙස ක්‍රි.ව. 1808 හත්කෝරළය මෝලිගොඩ සහ ඇහැලේපොළ අතර බෙදන ලදි. පෙර සිට චිරාගතව පැවති සම්ප්‍රදායන් බිඳ දැමූ රජු උඩගම්පහේ සහ පල්ලේගම්පහේ නිල දෙකට අතිරේකව තම සියපත්තුවේ අදිකාරම නමින් තනතුරක් ඇති කිරීම ප්‍රභූන් පිළිගත්තේ නැත.

රජතුමා රදළ බලය බිඳින අතර මහජනතාවගේ ප්‍රසාදය දිනාගැනීමේ පිළිවෙත් ගෙන ගියේය. මහජනයා තළා පෙළා කටයුතු කළ රාජ්‍ය නිලධාරීන්ම දැඩි දඬුවම් ලබාදෙන අතර, අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල පාලනයට පියවර ගත්තේය. උඩරට සමාජය දූසිරිතින් තොරව තබාගැනීමට උත්සහ කරන ලදි. දළදා මැඳුරේ නව පත්තිරිප්පුවක් සහ බෝගම්බර වැව විශාල කිරීමේ කටයුතුවල නිරත විය. එපමණක් නොව මංමාවත් ඉදිකිරීම සහ කුන්ඩසාලේ මලබාර් වීදියේ තල්වත්තේ සිට උයන්වත්ත දක්වා දිය අගල්ද කප්පවන ලදි.[10] මේ සෑම ක්‍රියාවකටම නොයෙක් පළාත්වල වැසියාට සිදුවුයේ රාජකාරි සේවාව මත රාජකාරිවල නිරතවීමටය. අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා මහජනතාව යොදාගැනීමත් සමග රජුට එරෙහිව වලපනේ සහ සබරගමුවේ ජනතාව කැරලි ගැසුහ. නමුත් රජු විශ්වාස කළේ මෙකී සියලු විරෝධතාවයන්ට පිළිමතව්වේ වග කිවු බවයි.

රජු මානසික අසහනයකින් පෙළුණු අයෙකු බවට ප්‍රචලිත විය. විශේෂයෙන්ම 1812 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ යකඩ දෝලියකගෙන් උපන් පුතෙකු වූ මාම්පිටියේ බන්ඩාර රාජද්‍රෝහියෙකු වශයෙන් සළකා මරණයට පත් කළේය. තවද මත්ද්‍රව්‍ය පානයටත් කාමුක ක්‍රියාවන්ටද හෙතෙම පුරුදු වුනේය.[11] රජු නොසිතූ අවස්ථාවක පිළිමතව්වේ ජා මිනිසුන්ට අල්ලස් ලබාදී ඔහු මැරවීමට කුමන්ත්‍රණය කළේය. නොසිතූ ලෙස කුමන්ත්‍රණය හෙළි වී වැරදි කරුවන්ට දැඩි දඬුවම් ලබාදුන්නේය. මෙම කුමන්ත්‍රණයට සෘජු වශයෙන් නායකත්වය ලබාදුන් පිළිමතව්වේ සහ රත්වත්තේ යන දෙදෙනාට 1812 දඬුවම් ලබාදෙන ලදි. හිස්වූ මහා අදිකාරම ධූරයට ඇහැලේපොළ පත් කළත් ඔහු ගැනද විශ්වාසයක් නොතැබීය. බ්‍රිතාන්‍යයන් සමග රහසේ සබඳතා පත්වමින් කෙසේ හෝ රජකම ලබාගැනීමට ඇහැලේපොළ මානබැලීය. රජු තමාට පහරදීම අර අඳින බව දැනගත් ඔහු රජුට එරෙහිව සබරගමුවේ කැරැල්ලක් ඇති කළේය. අපේක්ෂිත පරිදි මහජනතාවගේ සහ බ්‍රිතාන්‍යන්ගේ සහයෝගය නොලැබුණු නිසා එය අසාර්ථක විය. කැරැල්ල මර්දනයට 1812 සේනාවක් රැගෙන මොලිල්ගොඩ සබරගමුවට ගිය විට ආරක්ෂාව පතා ඇහැලේපොළ ඉංග්‍රීසින් වෙත පලා ගියේය.

එදා සබරගමුවේ කැරැල්ලට සම්බන්ධ වූ විශාල පිරිසකට දරුණු දඬුවම් ලබාදුන්නේය. හිස ගසාදැමීම, උල තැබීම, කසපහරදීම සහ ඇතැම් පිරිස් සිරභාරයට ගත්තේය. ඇහැලේපොළ මහාධිකාරම් මහනුවරට කැඳවනු ලැබුවත් ඔහු ඊට කීකරු නොවිය. ඉන් කෝපයට පත් රජු ප්‍රාණ ඇපකරුවන් ලෙස ඇහැලේපොළගේ අඹු දරුවෝ සිරභාරයට ගත්තේය. මෙම පවුලේ සිටි පිරිස ලෙස ඇහැලේපොළ කුමාරිහාමි, පුස්වැල්ලේ කුමාරි සහ දරුවන් හතර දෙනෙකු සිටියහ.[12] මෙකී සියලුදෙනා පියා කළ වරදට ජාතියම කම්පාවන ආකාරයේ දඬුවමකට ලක්වූහ.



ඇහැලේපොල දරු පවුල ඝාතනය

පෙර සිරිතට අනුව වරදකරුවන්ට දඬුවම් ලබාදීම සාධාරණය. නමුත් නිවැරදිකරුවන් දණ්ඩනයට ලක් කිරීම අසාධාරණය. ස්ත්‍රීන්ට මරණ දඬුවම ලබාදීම උඩරට දණ්ඩ නීති සංග්‍රහයේ අනුමත වුවත් පරම්පරා ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක නොවීය. රජු ඇහැලේපොළ පවුලට ලබාදුන් දඬුවම් දෙස බලන විට උඩරට රාජ නීතිය හා මනුෂ්‍යත්වය ඉක්මවා ක්‍රියා කළ අවස්ථාවකි. රජතුමා කෙරෙහි ජනතාවගේ සිත වඩාත් කළකිරීමට පත්වූයේ දඬුවම් ලබාදීමට නාථ දේවාලයේ "දේව සංහිඳ" නම් ස්ථානය භාවිත කිරීමයි. ඇහැලේපොළ නඩු තීන්දුවේදී ඊට සම්බන්ධ සියළුදොනට මරණ දඬුවම් ලබා දුන්නේය. සොහොයුරා හා දරුවන්ගේ හිස ගසා දැමීමටත් ස්ත්‍රීන් දියේ ගිල්වා මරා දැමීමටත් රජ අණ ලැබිණි. මෙම දඬුවම නිසා මුළු උඩරට රාජ්‍යයම කම්පාවට පත් කළේය. එදින ජාතික ශෝක දිනයක් ලෙස සළකන ලදි. කිසිදු නිවසක ගිනි නොදැල්වූ අතර ආහාර ගැනීමක්ද නොවීය.

උඩරට ජනතාව අතර භේදය පුළුල් වෙමින් පවතින අතර නව ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ලෙස රොබට් බ්‍රවුන්රිග් පත්විය. ඔහුගේ ප්‍රධාන අපේක්ෂාව වූයේ උඩරට කිරුළ ලබා ගැනීමය. උඩරට රජුගේ පීඩාදායක පාලනයෙන් ලංකාවේ අභ්‍යන්තරය මුදාගැනීමට හොඳම අවස්ථාව මෙය බව වටහාගෙන ක්‍රියා කළේය. ක්‍රි.ව. 1814 නොවැම්බරයේදී උඩරට රාජ්‍යයේ වෙළඳාමේ යෙදී සිටි බ්‍රිතාන්‍ය යටත් වැසියන් දස දෙනෙකුගේ අත්පා කැපීමෙන් වධ හිංසාවට පත් කළේය. සෙසු තිදෙනා නැවත කොළඹට යවන ලදි. මෙම සිදුවීමෙන් කෝපයට පත් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරටට විරුද්ධව 1815 ජනවාරි 10 වන දින යුද්ධ ප්‍රකාශ කළේය. ඇහැලේපොළගේ උපදෙස් පරිදි කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව හා මීගමුවෙන් පිටත් වූ සේනා කන්ද උඩරටට ළඟාවිය. නමුත් ඒ අවස්ථාවේ "වඩුග" රජුගෙන් තමන් බේරා ගැනීමට පැමිණි සුර දූතයන් ලෙස ඉංග්‍රීසි සේනා සැළකීමට උඩරට ජනතාව පෙළඹුණි. ආක්‍රමණයට මුහුණ දීමට නොහැකි වූ රජු ඇතුළු පිරිස මැද මහනුවර "බෝමුරේ" ග්‍රාමයට පලා ගියහ. සිංහලයින්ගේ මග පෙන්වීම යටතේ රජු ඇතුළු පිරිස 1815 පෙබරවාරි 18 වන දින ජීවග්‍රහයෙන් අල්ලා ගත්හ. කෝපයට පත් සබරගමුවේ ජනතාව සාහසික ලෙස රජු ඇතුළු පිරිසට වධ හිංසා කළහ. "බලයේ සිටි පුද්ගලයා බෙලහීන වූ විට බලයෙන් උද්දාමයට පත් සිංහලයෝ තම ජාතිය විනාශ කිරීම එදා පමණක් නොව අදද සිදු කරති." රජුගේ කෲර පාලනයෙන් මුදා ගත් ඉංග්‍රීසින් තමන්ට විමුක්තිය සළසා දෙනු ඇතිබව විශ්වාස කළ උඩරට ජනයාට හා භික්ෂූන්ට එතරම් කාලයක් යාමට පෙර කරුණු කරණා අවබෝධ විය. ඒ වන විටත් ඔවුන් ප්‍රමාද වැඩි විය.

# පාදක සටහන්


(1) අභයසිංහ ටිකිරි, ලෝනා දේවරාජ, සෝමරත්න, <u>උඩරට රාජධානිය</u>, ලේක්හවුස්, කොළඹ, 1977, පිටු. 111.

(2) <u>වාරියපොළ හිමි -</u> කොළඹ, 1977, පිටු. 21.

(3) <u>උඩරට රාජධානිය</u> - කොළඹ, 1977, පිටු. 109.

(4) <u>වාරියපොළ හිමි</u> - කොළඹ, 1977, පිටු. 23.

(5) කොඩ්රිංටන් එච්.ඩබ්. <u>සංක්ෂිප්ත ලංකා ඉතිහාසය</u>, කොළඹ, සංශෝධිත මුද්‍රණය, 1939, පිටු. 167.

(6) Mendis G.C. <u>Ceylon under British</u> , Second Revised Editior, Colombo, 1948, p.13. .

(7) ද සිල්වා, කොල්වින්. ආර්. <u>බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාව,</u> පිටු 80.

(8) <u>සංක්ෂිප්ත ලංකා ඉතිහාසය</u>, එම, පිටු 69.

(9) <u>උඩරට රාජධානිය,</u> එම, පිටු 115.

(10) පෙරේරා, එස්.ජී. <u>ලංකා ඉතිහාසය,</u> එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ, 1945, පිටු. 53.

(11) <u>ලංකා ඉතිහාසය,</u> එම , පිටු. 53.

(12) <u>වාරියපොළ හිමි,</u> එම , පිටු. 44.